# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1854/38 - 2014 මාර්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2014.03.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/10/2012. නඩු අංකය : ඒ/3514

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.07.11 දිනැති හා අංක 1818/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.05.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාකේවිට, කලුවැල්ගොඩ, මහවත්ත, නො. 49හි පදිංචි ආර්. කේ. ඩී. බී. ජී. රණවීර මෙය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 09, බේස්ලයින් පාර, දෙවන මහල, නො. 758හි පිහිටි සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.02.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 මාර්තු මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/15/10/2012.

කාර්මික අධිකරණයේ දී ය.

එක් පාර්ශ්වයක් වශයෙන්
ආර්. කේ. ඩී. බී. ජී. රණවීර මෙය,
නො, 49, මහවත්ත,
කලුවැල්ගොඩ,
මාකේවිට.

අනෙක් පාර්ශ්වය වශයෙන්,
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
නො. 758, දෙවන මහල,
බේස්ලයින් පාර,
කොළඹ 09.

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(I) වන වගන්තියෙන් ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2013.05.31 නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරවුල මෙසේය.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි සේවයේ නියුතු ආර්. කේ. ඩී. බී. ජී. රණවීර මෙනවියට 2009 ජූලි මස සිට 2013 පෙබරවාරි මස දක්වා වාර්ෂික වැටුප් වර්ධක ලබා නොදීම සම්බන්ධයෙන්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කිසියම් අසාධාරණයක් සිදු වී ඇත්ද? එසේ නම් හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

පාර්ශ්වයන් පළමු ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව මෙම ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශ්වයට බේරුම්කරණයට කැඳවන ලදී. එම අවස්ථාවේ දී ඉහත ආරවුල සමථයට පත් කර ගැනීම සඳහා කටයුතු කරන බව දැනුම් දීම හේතු කොට ගෙන ඒ සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා නැවත දිනයන් පාර්ශ්වයන්ට ලබා දෙන ලදී. මෙම ආරවුල බේරුම්කරණයට යොමු කිරීමෙන් පසුව ඉල්ලුම්කාරිය වගඋත්තරකාර අධිකාරියෙන් ඉල්ලා අස්වීමේ ලිපියක් යොමු කර තිබූ බවද එම ලිපිය වගඋත්තරකරු විසින් භාර ගත් බවද බේරුම්කරණයට දැනුම් දෙන ලදී.

ඉල්ලුම්කාරිය හා වගඋත්තරකාර අධිකාරියේ සභාපතිවරයා අතර ඉහත ආරවුල සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වීමෙන් අනතුරුව ගිවිසුමක් ඇති වූ බව සඳහන් කළද ඊට අදාළ කොන්දේසි හෝ අදාළ ගිවිසුම බේරුම්කරණයට ඉදිරිපත් කිරීමට ද පාර්ශ්වයන් අපොහොසත් විය.

ඉල්ලුම්කාරියට ගෙවීමට ඇති වැටුප් වර්ධක ගෙවීමට එකඟ වූ බවද ඒ අනුව ගෙවිය යුතු හිඟ වැටුප් වර්ධක මුදල රු. 16,468.75ක් බව වගඋත්තරකරු බේරුම්කරණයට දැනුම් දෙන ලදී. ඉහත මුදලින් සේවක අර්ථ සාධක අරමුදල ලෙස ගෙවිය යුතු 10% ප්‍රමාණය වන රු. 1,646.88ක් බවද එකී මුදල අඩු කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කාරියට රු. 14,821.88 ක් හිමි බව වගඋත්තරකරු සඳහන් කළ අතර එම ගණනය කිරීම නිවැරදි බව ඉල්ලුම්කාරිය බේරුම්කරණයේදී පිළිගන්නා ලදී.

ඉල්ලුම්කාරිය සිය ධූරයෙන් ඉල්ලා අස්වී ඇති හෙයින් ඉල්ලුම්කාරියට පාරිතෝෂික මුදල හිමි බවත්, ඒ අනුව අදාළ මුදල රු. 88,320.00ක් බවද, වගඋත්තරකරු බේරුම්කරණයට දැනුම් දෙන ලදී.

ඉල්ලුම්කාරිය වගඋත්තරකාර අධිකාරියෙන් ආපදා ණය මුදලක් ලබා ගෙන ඇති බවද ඒ අනුව ගෙවිය යුතු හිඟ ප්‍රමාණය රු. 1,08,376.04ක් බව වගඋත්තරකරු සඳහන් කළ අතර ඉල්ලුම්කාරියද ඉහත ප්‍රමාණය ගෙවිය යුතු බව බේරුම්කරණයට දැනුම් දෙන ලදී.

ඉල්ලුම්කාරිය හිඟ වැටුප් වර්ධක වන රු. 14,821.88ක මුදල හා ඇයට හිමි පාරිතෝෂික මුදල වන රු, 88,320 ක මුදලින් ඉහත ණය මුදල පියවීමට බේරුම්කරනයේදී ඉල්ලුම්කාරිය එකඟ විය.

ඉහත මුදල අඩු කිරීමෙන් අනතුරුව රු. 5,234ක් ණය ප්‍රමාණයන් ඉතිරිව තිබෙන බව ද එකී මුදල ඇය පුද්ගලිකව ගෙවන බවද බේරුම්කරණයේදී දැනුම් දෙන ලදී.

මෙම බේරුම්කරණයට ඉදිරිපත් වූ කාර්මික ආරවුල වන්නේ ඉල්ලුම්කාරියට 2009 ජූලි සිට 2013 පෙබරවාරි දක්වා වාර්ෂික වැටුප් වර්ධක ලබා නොදීමය. මෙම යොමු කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කාරිය සේවයෙන් ඉල්ලා අස්වී ඇති හෙයින් පාරිතෝෂිකය හා ණය ප්‍රමාණය ගෙවීම සම්බන්ධව තත්වය මතු වී තිබෙන බව පිළිගත හැකිය.

ඉහත අධිකාරියේ සේවකයින් පහළොස් දෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් සේවයේ සිටින හෙයින් පාරිතෝෂික ගෙවීම සම්බන්ධව පූර්ණ බලය කම්කරු කොමසාරිස්වරයා සතු වන හෙයින්ද, ඉල්ලුම්කාරිගේ ඉල්ලා අස්වීමේ ලිපිය සඳහන් දිනය පරිදි ඉල්ලුම්කාරිය යම් අධිභාරයක් හිමි වන්නේ නම් එය ලබා ගැනීමේ අයිතිය මෙන්ම පාරිතෝෂික ගණනය පිළිබඳව යම් දෝෂයක් වෙතත් එය නිවැරදි කර ගැනීමේ ව්‍යවස්ථාපිත හිමිකම් වලට අගතියක් නොවන පරිදි පාරිතෝෂික ගෙවීම් සිදුවිය යුතුය. මේ අනුව මෙම සමථයට පාරිතෝෂික ගෙවීම අදාළ නොවනු පරිදි මෙම ආරවුල සමථයට පත් කරමි.

බේරුම්කරණයට යොමු කර ආරවුල පරිදි ඉල්ලුම්කාරියට ගෙවිය යුතු වැටුප් වර්ධක ප්‍රමාණය හා ඊට අදාළ මුදල වන රු, 14,821.88 හිඟ වැටුප් වර්ධක මුදල නිවැරදි හෙයින්ද ඉහත අදාළ ඉල්ලුම්කාරිය විසින් සිය කැමැත්තෙන්ම ලබා ගත් ණය මුදලට එකී මුදල ගෙවීමට එකඟ වීම හා වගඋත්තරකරු ඊට අනුමැතිය ලබා දීම යන කරුණු සැලකිල්ලට ගෙන ඉහත ආරවුල සමථයට පත් කරමි.

ඉහත සමථය සාධාරණ හා යුක්ති සහගත වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

පාලිත වීරසේකර,
බේරුම්කරු.

2014ක්වූ පෙබරවාරි මස 11 වැනි දින.

04 - 166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.